2025 ජනවාරි මස 01 වන දින,

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ
ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ,

සියලුම කාර්යාංශ/ අනු කාර්යාංශ ප්‍රධානීන් සහ සියලුම සේවක මහත්ම, මහත්මීන් වෙත.

## 2025 නව වසරට සුභ පැතුම්

ලැබුවා වූ 2025 නව වසරේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ ඔබ සියලු දෙනා වෙත සුභ පැතුම් පණිවිඩයක් නිකුත් කිරීමට හැකි වීම සතුටට කරුණකි.

පොහොසත් රටක් සහ ලස්සන ජීවිතයක් නිර්මාණය කර ගැනීමේ අත්‍යවශ්‍ය සාමූහික කැපවීම, ජනතා කේන්ද්‍රීය බලශක්ති පරිවර්තනයක් ඇතිකරලීමේ මූලික ප්‍රතිපත්තිය පදනම් කරගෙන අප සැම තිර අදිටනින් කැප විය යුතුව ඇත.

ඉතිහාසයේ කිසි දිනෙක අත් නොදුටු ආර්ථික අර්බුදයකට මුහුණ දෙමින් ඉදිරියට ගමන් කරන මෙම කාල පරිච්ඡේදයේ ආර්ථිකයේ ඇති වූ පසුබෑම තුළ වුවද, රටේ බලශක්ති සුරක්ෂිතතාවය සහතික කිරීම සඳහා වෘත්තීමය සහ අවංක ප්‍රවේශයක් ගනිමින් ආයතන දෙකෙහිම සියලුම සේවක මහත්ම, මහත්මීන් දැක් වූ කැපවීම ප්‍රශංසනාත්මකව සිහිපත් කරන අතර, ශ්‍රී ලාංකීය ජනතාව අප වෙතින් අපේක්ෂාකර සිටින සේවාවන් කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකිරීමට ඔබ සැමගේ සක්‍රීය දායකත්වය හා කැපවීම තවදුරටත් අවශ්‍යව ඇත.

ආදර්ශය ලබා දීම, පෙලඹවීම, යොමු කිරීම සහ වෙනස් වීමේ අවශ්‍යතාව ශක්තිමත්ව තහවුරු කිරීම තුළින් ආයතනයක පුද්ගල චර්යාමය වෙනස්කම් සිදුකිරීමේ ශක්තිමත් ප්‍රවේශයක් ලබා ගත හැකි ය. ඒ සඳහා ආයතනික කළමනාකාරීත්වයත් ඔබ සියලු දෙනාත් එක්ව, සාමූහිකව එක් අරමුණක් හා දිශානතියක් ඉලක්ක කර ගනිමින් කටයුතු කළ යුතුව ඇත.

ජාතික ආර්ථිකයේ සියලු අංශයන් හී එනම් ප්‍රවාහන, විදුලිබල සැපයුම, කර්මාන්ත, කෘෂිකර්ම, ධීවර, යනාදී අංශයන් හී ක්‍රියාකාරීත්වය බලශක්තිය සැපයුම මත රඳා පවතින බැවින් එම අංශවල සුමට ක්‍රියාකාරීත්වයක් පවත්වගෙන යාම සඳහා, ඉල්ලුමට සරිලන සැපයුමක් පවත්වාගෙන යාම අත්‍යාවශ්‍ය වේ. එබැවින්, ජාතික ආර්ථිකයට බලශක්ති අංශය දක්වන වැදගත්කම සහ දායකත්වය සැලකිල්ලට ගෙන රටෙහි බලශක්ති සුරක්ෂිතතාවය තහවුරු කරමින් මේ වර්ෂයේදී ඉන්ධන ආනයනය හා බෙදා හැරීම සඳහා නව්‍ය පද්ධති සහ උපාය මාර්ග ක්‍රමානුකූලව ක්‍රියාත්මක කරමින් සැපයුම් ගැටලු සාර්ථකව කළමනාකරණය කළ යුතුව ඇත.

ඩිජිටල්කරණය මෙවලමක් ලෙස යොදා ගනිමින් හැකි සෑම විට ම අප ආයතන වල කාර්යක්ෂමතාව, ගුණාත්මකභාවය, නිරවද්‍යතාව සහ විනිවිදභාවය ඉහළ නැංවන පරදි කටයුතු කරමින් ලැබුවා වූ 2025 වර්ෂය සාධනීය පරිවර්තනයක අඩිතාලමක් කර ගත යුතුය.

එබැවින්, අපගේ ප්‍රගතියට ඉවහල් වූ අගනා උපදෙස්, මගපෙන්වීම, සහයෝගය සහ ඔවුන්ගේ කැපවීම පිළිබඳව ගරු බලශක්ති අමාත්‍ය - කුමාර ජයකොඩි මැතිතුමා, බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් - මහාචාර්ය කේ.ටී.එම්. උදයංග හේමපාල මහතා සහ බලශක්ති අමාත්‍යාංශයේ නිලධාරීන් වෙත මාගේ හෘදයාංගම ස්තුතිය පුද කිරීමට කැමැත්තෙමි.

පුනුරුද යුගයක් කරා ගමන්කරන මෙම නව වසරේදී ආයතන දෙකෙහිම කළමනාකාර අධ්‍යක්ෂවරුන්ගේ මගපෙන්වීම යටතේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ කැපවීම මත ඔබ සියලු දෙනාගේ සක්‍රිය සහභාගීත්වයෙන් අභියෝග ජයගෙන ආයතනික අරමුණු ඉටුකර ගැනීම සඳහා සියලු දෙනාගේම කැපවීම ඉතා ඕනෑකමින් බලාපොරොත්තු වන අතර, ඒ සඳහා උපරිමයෙන් කැපවීමට අප සියලු දෙනා අදිටන් කර ගනිමු.

ලැබුවා වූ 2025 නව වසර ඔබ සියලු දෙනාගේ යහපත් පැතුම් ඉටුවන ප්‍රීතිමත් හා වාසනාවන්ත නව වසරක් වේවායි! ප්‍රාර්ථනා කරමි.

ඩී.ජේ.ඒ.එස්. ද එස්. රාජකරුණා
සභාපති
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව /
ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම